**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 04 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

-----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2 ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 244.93 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 149.34 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 95.59 ක් හෙවත් සියයට 39.03 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 44.93 | 39.84 | 5.09 | 11.33 |
| මූලධන | 200.00 | 109.50 | 90.50 | 45.25 |
| **එකතුව** | **244.93** | **149.34** | **95.59** | **39.03** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 33201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,000,000 | 658,516 | 200,000 | 585,782 | 3,000,000 | 2,002,100 |

## 2.3 විගණන නිරීක්ෂණය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

## 3.2 විසර්ජන ගිණුම

-----------------

### 3.2.1 අයවැය විචලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් පහක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---------------------------------------------------------------------

විෂය අංක 33201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව 2015 දෙසැම්බර් 31 දිනට සාමාජික ණය ලේඛනයේ ශේෂය හා එදිනට දෙපාර්තමේන්තු පාලන ගිණුම අනුව ශේෂය අතර රු.92,616 ක වෙනසක් පැවතුණි.

(ආ) සාමාජික ණය ලේඛනයේ (CC 10) ඇතුළත් රු.215,000 ක් වූ ණය ශේෂ දෙකක් 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම II හි ඇතුළත් කර නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ මුදල් පොතට අනුව එකී ශේෂය පවරා ගැනීම වෙනුවෙන් බාහිර ආයතන වෙත මුදල් ගෙවා තිබුණි.

(ඇ) අත්තිකාරම් ගිණුමේ වර්ෂයට අදාළ මුළු වියදම දෙපාර්තමේන්තු පොත් අනුව රු.658,516 ක් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව රු.1,478,712 ක් වීම හේතුවෙන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව රු.820,196 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

------------------------------------------

### 3.4.1 අභ්‍යන්තර විගණනය

------------------------

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

----------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

දෙපාර්තමේන්තුවේ වාහන 47 ක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආයතන සතු එකතුව රු. 19,487,779 ක් වූ වාහන 12 ක් විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගෙන තිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.6 කාර්යසාධනය**

---------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

2015 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යසාධන වාර්තාව ප්‍රකාරව ශ්‍රී ලංකාව පුරා ප්‍රජා මූල සංවිධාන 3,666 ක් හඳුනාගෙන තිබූ අතර ඉන් 1260 ක් වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කර නොතිබුණි.

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

2015 ජනවාරි මාසයේ සිට නොවැම්බර් 15 දින දක්වා මාස 11 ½ ක කාල සීමාව තුළ ප්‍රජා මූල සංවිධාන සඳහා නඩත්තු පුහුණු වැඩසටහන් 37 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබූ අතර ඉන් 11 ක් පමණක් පවත්වා තිබුණද, වැඩසටහන් ඉටු නොකිරීමේ ප්‍රතිශතය සියයට 70 ක් පමණ විය.

**(ඇ) අක්‍රීය ජල ව්‍යාපෘති**

--------------------

දිස්ත්‍රික්ක 18 ක අක්‍රීය ජල ව්‍යාපෘති 393 ක් පවතින බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 24 | 05 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 307 | 46 | 261 |
| (iii) | ද්විතියික මට්ටම | 54 | 34 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 70 | 39 | 31 |
| | එකතුව | 455 | 124 | 331 |